**ශීර්ෂය - 166 ජල සම්පාදන හා ජලාපවහන අමාත්‍යාංශය**

**විගණකාධිපති වාර්තාව - 2012 වර්ෂය**

1.1 විගණන විෂය පථය

ජලසම්පාදන හා ජලාපවහන අමාත්‍යාංශයේ 2012 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය වාර්තා, සැසඳුම් ප්‍රකාශන පොත් පත්, ලේඛන හා අනෙකුත් වාර්තා අන්තර්ගත වූ විසර්ජන ගිණුම ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවෙහි ඇතුළත් විධිවිධාන යටතේ විගණනය කරන ලදි. සමාලෝචිත වර්ෂය සඳහා වූ කළමනාකරණ විගණන වාර්තාව 2013 දෙසැම්බර් 24 දින අමාත්‍යාංශයේ ලේකම්වරයා වෙත නිකුත් කරන ලදි. ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළිබඳ විගණන නිරීක්ෂණ, අදහස් දැක්වීම් සහ සොයා ගැනීම්, විගණනය සඳහා ඉදිරිපත් කරන ලද ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළිබඳ සමාලෝචනය සහ ගනුදෙනුවල නියැදි පිළිබඳ තහවුරු පරීක්ෂා කිරීම් මත පදනම් වී ඇත. එම සමාලෝචනය හා පරීක්ෂණයන්ගේ විෂය පථය සහ ප්‍රමාණය, මට ලැබී ඇති කාර්ය මණ්ඩලය අනෙකුත් සම්පත් හා කාල වේලා යන සීමාවන් ඇතුළත හැකිතාක් පුළුල් විගණනයක් කළ හැකි වන පරිදි පිළියෙල කරන ලද්දකි.

1.2 ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන සම්බන්ධයෙන් ප්‍රධාන ගණන්දීමේ නිලධාරිගේ වගකීම

විසර්ජන ගිණුම හා සැසඳුම් ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 148,149,150 හා 152 ව්‍යවස්ථාවන්, වෙනත් ව්‍යවස්ථාපිත විධිවිධානයන්, රාජ්‍ය මූල්‍ය හා පරිපාලන රෙගුලාසිවලට අනුකූලව පවත්වා ගෙන යාම, පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම ප්‍රධාන ගණන්දීමේ නිලධාරිගේ වගකීම වේ. වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර වූ ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාල වන අභ්‍යන්තර පාලනයන් සැලසුම් කිරීම, ක්‍රියාත්මක කිරීම සහ පවත්වා ගෙන යාමත් මෙම වගකීමට ඇතුළත් වේ.

1.3 විගණන නිරීක්ෂණ

2012 දෙසැම්බර් 31 දිනට මූල්‍ය වාර්තා හා පොත් අනුව ජලසම්පාදන හා ජලාපවහන අමාත්‍යාංශයේ විසර්ජන ගිණුම හා සැසඳුම් ප්‍රකාශ මෙහි (අ) සිට (ඈ) දක්වා වූ පොදු නිරීක්ෂණ සහ පහත 1.4 සිට 1.8 දක්වා ඡේදවල සඳහන් ප්‍රධාන විගණන සොයා ගැනීම් හැර සතුටුදායක ලෙස පිළියෙල කර ඇති බව නිරීක්ෂණය විය.

**(අ)** අයවැය විචලනය

පහත සඳහන් කරුණු නිරීක්ෂණය විය.

(i) වැය විෂයයන් 07 ක් සඳහා සළසා තිබුණු රු.561,550,000ක මුළු ශුද්ධ ප්‍රතිපාදනයම ඉතිරි කර තිබුණි.

(ii) වැය විෂයයන් 25 ක් සඳහා අධි ප්‍රතිපාදන සළසා තිබීම හේතුවෙන් ප්‍රතිපාදන උපයෝජනය කිරීමෙන් පසු ඉතිරිය රු. 1,540,548,346 ක් වූ අතර එය එම වැය විෂයයන්ට අදාල ශුද්ධ ප්‍රතිපාදනයෙන් සියයට 22 ත් 98 ත් අතර පරාසයක් ගෙන තිබුණි.

(iii) වැය විෂයයන් දෙකකට අදාලව අයවැය ඇස්තමේන්තුවෙන් සළසා තිබුණු ප්‍රතිපාදනයට අතිරේකව පරිපූරක ඇස්තමේන්තු වෙන්කිරීම් මඟින් රු. 127,000,000 ක ප්‍රතිපාදන සළසා ගෙන තිබුණත් එම ප්‍රතිපාදනය මුළුමනින්ම ඉතිරිකර තිබුණි.

(iv) අවස්ථා 18 ක දී විදේශීය මූල්‍ය සම්පාදන ව්‍යාපෘති වැය විෂයයන් දෙකකට අදාලව වාර්ෂික අයවැය ලේඛනයෙන් රු.2,980,000,000 ක ප්‍රතිපාදන සළසා ගෙන තිබුණු නමුත් එම මුළු ප්‍රතිපාදනයම මුදල් රෙගුලාසි 66 යටතේ වෙනත් ව්‍යාපෘතිවලට මාරු කර තිබුණි.

(v) සමාලෝචිත වර්ෂයේ විසර්ජන ගිණුමේ රු.75,248 ක් වූ බැරකම් සඳහන් කර නොතිබුණි.

(ආ) පොදු තැන්පත් ගිණුම්

2012 දෙසැම්බර් 31 දිනට අමාත්‍යාංශයේ පොදු තැන්පත් ගිණුම්වල එකතුව රු1,049,416 ක ශේෂයක් නිරීක්ෂණය වූ අතර ඒ පිළිබඳ විස්තර පහත දැක්වේ.

| **ගිණුම් අංකය** | **2012 දෙසැම්බර් 31 දිනට ශේෂය** |
|---|---|
| | රු. |
| 6000-0000-00-0015-0076 | 906,783 |
| 6000-0000-00-0011-0575 | 142,633 |
| | 1,049,416 |

මෝටර් රථයක් මිලදී ගැනීම සඳහා 2011 වර්ෂයේදී අංක 6000-0000-00-0011-0575 දරන තැන්පත් ගිණුමට රු. 5,500,000 ක් බැර කර තිබුණු අතර එම මුදල උපයෝගී කරගෙන 2012 වර්ෂයේදී මෝටර් රථයකට ගෙවීම් කර තිබුණි ඒ අනුව ඉතිරි වූ රු.142,633 ක මුදල රාජ්‍ය ආදායමට 2013 මැයි 31 දින වන විටත් බැර කර නොතිබුණි.

(ඇ) රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම පිළිබඳ සැසඳුම් ප්‍රකාශය

විෂය අංක 16601 දරන රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම පිළිබඳ 2012 දෙසැම්බර් 31 දිනට සැසඳුම් ප්‍රකාශය ප්‍රකාරව එදිනට අයවීම් හිඟ හිට තිබුණු ශේෂවල එකතුව රු.38,095 ක් වූ අතර, එම හිඟ හිටි ශේෂ අයකර ගැනීම සඳහා සමාලෝචිත වර්ෂයේදී ද කිසිදු ක්‍රියාමාර්ගයක් ගෙන නොතිබුණි.

## 1.4 යහපාලනය හා ගිණුම්කටයුතුභාවය

### 1.4.1 වාර්ෂික ප්‍රසම්පාදන සැලැස්ම

2006 මාර්තු 24 දිනැති අංක 128 දරන ජාතික අයවැය චක්‍රලේඛය ප්‍රකාරව වාර්ෂික ප්‍රසම්පාදන සැලැස්ම 2012 දෙසැම්බර් 31 දින වන විටත් පිළියෙල කර නොතිබුණි.

### 1.4.2 අභ්‍යන්තර විගණනය

මේ සම්බන්ධයෙන් පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) 2009 ජුනි 09 දිනැති අංක ඩීඑම්ජ්/2009/(1) දරන කළමනාකරණ විගණන චක්‍රලේඛයේ 03 ජේදය අනුව ප්‍රධාන ගණන් දීමේ නිලධාරියාගේ ඍජු අධීක්ෂණය යටතේ ගණකාධිකාරී සේවයේ ජ්‍යෙෂ්ඨ නිලධාරියෙකු ප්‍රධානත්වය දරන අභ්‍යන්තර විගණන හා විමර්ශන අංශයක් සෑම අමාත්‍යාංශයකම පවත්වා ගතයුතු වුවත්, වසරක පමණ කාලයක සිට අභ්‍යන්තර විගණන නිලධාරියෙකු නොමැතිව කළමනාකාර සහකාර සේවයේ නිලධාරිනියක හා පුහුණුවන උපාධිධාරිණියකගෙන් පමණක් අමාත්‍යාංශයේ අභ්‍යන්තර විගණන අංශය පවත්වා තිබුණි.

(ආ) ඉහත (අ) හි සඳහන් චක්‍රලේඛයේ 09 ඡේදය ප්‍රකාරව කාර්තුවකට වරක් අභ්‍යන්තර විගණන වාර්තාවල සාරාංශයක් පිළියෙල කර එය විගණන හා කළමනාකරණ කමිටුවෙහි සාකච්ඡාවට ඉදිරිපත් කර නොතිබුණි. තවද මුදල් රෙගුලාසි 134 (1) (3) ප්‍රකාරව සමාලෝචිත වර්ෂයට අදාල අභ්‍යන්තර විගණන වාර්තාවල පිටපත් විගණකාධිපති වෙත ඉදිරිපත් කර නොතිබුණි.

(ඇ) සමාලෝචිත වර්ෂය වෙනුවෙන් වාර්ෂික ක්‍රියාකාරී සැලැස්මට අනුකූල වන පරිදි විගණන සැලැස්ම පිළියෙල කර නොතිබුණි.

1.5 වත්කම් කළමනාකරණය
-----------------------------

මේ සම්බන්ධයෙන් පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) 2010 දෙසැම්බර් 17 දිනැති අංක පීඑෆ්/සමීක්ෂණ මණ්ඩල/01 දරන රාජ්‍ය මුදල් අධ්‍යක්ෂ ජනරාල්ගේ ලිපිය මගින් සංශෝධිත 2009 දෙසැම්බර් 09 දිනැති අංක 441 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛය ප්‍රකාර 2012 වර්ෂය වෙනුවෙන් භාණ්ඩ සමීක්ෂණය සිදුකර නොතිබුණි.

(ආ) දෙනියාය ජල සම්පාදන යෝජනා ක්‍රමයට ඉඩම් අත්පත්කර ගැනීම 1984 වර්ෂයේදී ආරම්භ කර 2012 දෙසැම්බර් 31 දිනට වසර 28 ක් ඉක්මවා තිබුණත් 2013 මැයි 13 දින වන විටත් එය නිම කර නොතිබුණි. මේ සඳහා 2006 වර්ෂයේදී රු. 560,000 ක මුදලක් කොටපොල ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ තැන්පත් කර තිබුණි.

(ඇ) හලාවත ජලසම්පාදන ක්‍රමයේ නල මාර්ගය එලා ඇති ඉඩම් කොටස අත්පත් කර ගැනීම වෙනුවෙන් 2010 අප්‍රියෙල් 30 දින රු.1,731,875 ක් හලාවත ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ තැන්පත් කර තිබුණි. ජලය රැගෙන එන ප්‍රධාන නලය එලා ඇත්තේ පෞද්ගලික නිවසක් සඳහා වෙන්කොට ඇති ප්‍රවේශ මාර්ගය හරහා බැවින් නිවෙස් හිමියාගේ විරෝධතා හේතුවෙන් අත්පත් කර ගැනීමේ ඉදිරි කටයුතු ඇනහිට තිබුණි. මේ සම්බන්ධයෙන් සමාලෝචිත වර්ෂයේදී ද කිසිදු ක්‍රියාමාර්ගයක් ගෙන නොතිබුණි.

1.6 **නීති, රීති,රෙගුලාසි යනාදියට අනුකූල නොවීම**

නියැදි විගණන පරීක්ෂණවලදී නිරීක්ෂණය වූ නීති, රීති , රෙගුලාසි හා විධිවිධානවලට අනුකූල නොවූ අවස්ථා විග්‍රහ කර පහත දැක්වේ.

| <u>නීති, රීති හා රෙගුලාසිවලට යොමුව</u> | <u>අනුකූල නොවීම</u> |
|---|---|
| (අ) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය | |
| (i) මුදල් රෙගුලාසි 1646 | දෛනික ධාවන සටහන්වල මුල් පිටපත් හා මාසික සංසිද්ධි වාර්තා එළඹෙන මාසයේ 15 දිනට පෙර විගණකාධිපති වෙත ඉදිරිපත් කර නොතිබුණි. |
| (ii) මුදල් රෙගුලාස 1647 | අමාත්‍යාංශයට අයත් වාහන පිළිබඳ ලේඛනයක් පවත්වා නොතිබුණි. |
| (ආ) රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ | |
| (i) 1990 ඔක්තෝබර් 10 දිනැති අංක 41/90 දරන චක්‍රලේඛය | සෑම 06 මාසයකට වරක්ම වාහනවල ඉන්ධන දහනය පිළිබඳ පරීක්ෂා කර වාර්තා කළ යුතු වුවත්, නියැදි පරීක්ෂාවට භාජනය කරන ලද වාහන 11 ක් සම්බන්ධයෙන් එසේ කටයුතු කර නොතිබුණි. |
| (ii) 1992 පෙබරවාරි 18 දිනැති අංක 7/92 දරන චක්‍රලේඛය | වෙන්කළ වාහනවලට අදාලව වාහනයේ ලියාපදිංචි අංකය නිලධාරියාගේ නම හා පාවිච්චි කිරීමට අදාල අනුමැතිය සහිත ලේඛනයක් පවත්වා නොතිබුණි. |
| (iii) 1999 ඔක්තෝබර් 08 දිනැති අංක 22/99 දරන චක්‍රලේඛය | චක්‍රලේඛයට පටහැනිව අමාත්‍යාංශය යටතේ ඇති ප්‍රජා ජලහාරයේ දිස්ත්‍රික් සම්බන්ධීකරන නිලධාරීන් වෙත වාහන දෙකක් මුදාහැර තිබුණි. |

(ඇ) රාජ්‍ය මුදල් චක්‍රලේඛ
------------------------

| | |
|---|---|
| 2009 නොවැම්බර් 13 දිනැති අංක 438 දරන චක්‍රලේඛය | අමාත්‍යංශ භූමියේ ගර්හිත වාහන 04 ක් ගාල්කර තිබූ අතර ඒවා විධිමත් පරිදි අපහරණය කිරීමට හෝ ඒ පිළිබඳව වෙනත් සුදුසු ක්‍රියාමාර්ගයක් හෝ ගෙන නොතිබුණි. |

1.7 ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමේ දුර්වලතා
-----------------------------------------

විදේශාධාර ව්‍යාපෘති හැර අනෙකුත් ව්‍යාපෘතිවල ප්‍රමාදයන් පිළිබඳව විගණන නියැදි පරීක්ෂණවලදී අනාවරණය වූ නිරීක්ෂණ පහත දැක්වේ.

(අ) ජාතික ජලසම්පාදන හා ජලාපවහන මණ්ඩලය මගින් ක්‍රියාත්මක කරන සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යාපෘති 53 ක් වර්ෂ ගණනාවකට පෙර ආරම්භ කර තිබුණත් දීර්ඝ කාලයක් ගතවීමෙන් පසුවත් අවසන් කිරීමට කටයුතු කර නොතිබුණි. මින් ව්‍යාපෘති 16 ක් 2012 වර්ෂයේදී නිම කිරීමට අපේක්ෂා කළ නමුත් ඉන් ව්‍යාපෘතීන් 7 ක් පමණක් නිම කර තිබුණි. ව්‍යාපෘතීන් 21 ක් අවුරුදු 10 ඉක්ම වූ ඒවා වූ අතර එම ව්‍යාපෘති 21 වෙනුවෙන් මූලික ඇස්තමේන්තුව රු. මිලියන 2,593 ක් වුවත්, 2012 දෙසැම්බර් 31 දින වන විට මුළු වියදම රු. මිලියන 6,268 ක් වී තිබුණි . ඒ අනුව එම ව්‍යාපෘති 21 වෙනුවෙන් වූ මූලික ඇස්තමේන්තුව සියයට 142 කින් ඉක්මවා වැයකර තිබුණි. එම ව්‍යාපෘති නිම කිරීමට වසර ගණනාවක් ගතවී තිබීම හේතුවෙන් උද්ධමනයත් සමග පිරිවැය වැඩිවීම නිසා එම ව්‍යාපෘති විසින් ආයෝජනය කළ මුදල්වලට සරිලන ප්‍රතිලාභ ලබා ගැනීමට නොහැකිවී තිබුණි. එමෙන්ම එම ව්‍යාපෘති කඩිනමින් අවසන් නොකර නව ව්‍යාපෘතිද ආරම්භකර තිබුණි.

(ආ) ශක්‍යතා අධ්‍යයනය මගින් භූගත පරීක්ෂා සිදුනොකර ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම හේතුවෙන් මතුවූ ගැටළු නිසා ව්‍යාපෘති නිමකිරීමට ප්‍රමාද වී තිබූ අවස්ථා කීහිපයක් පහත දැක්වේ.

| ජලයෝජනා ක්‍රමයේ නම | 2012 දෙසැම්බර් 31 දිනට දරන ලද වියදම රු.මිලියන | ප්‍රමාදයට හේතුව |
|---|---|---|
| පැල්මඩුල්ල ජල යෝජනා ක්‍රමය(Intake) | 348.00 | තුළුමුව ලිදෙහි කළුගල් හසුවීම |
| යටියන්තොට ජල යෝජනා ක්‍රමය | 179.35 | කළුගල් හසුවීම හේතුවෙන් ජලනල එළීම ප්‍රමාද වීම |
| බොනවිස්ටා කන්ද ජල යෝජනා ක්‍රමය | 44.03 | ජලනල එළීමේදි කළුගල් මතුවීම |

1.8 මානව සම්පත් කළමනාකරණය

(අ) අනුමත සේවක සංඛ්‍යා හා තථ්‍ය සේවක සංඛ්‍යා

2012 දෙසැම්බර් 31 දිනට වු සේවක සංඛ්‍යාව පිළිබඳ තත්ත්වය පහත පරිදි විය.

| සේවක වර්ගය | | අනුමත සේවක සංඛ්‍යාව | තථ්‍ය සේවක සංඛ්‍යාව | පුරප්පාඩු සංඛ්‍යාව |
|---|---|---|---|---|
| (i) | ජ්‍යෙෂ්ඨ මට්ටම | 24 | 13 | 11 |
| (ii) | තෘතියික මට්ටම | 04 | 03 | 01 |
| (iii) | ද්විතියක මට්ටම | 82 | 61 | 21 |
| (iv) | ප්‍රාථමික මට්ටම | 39 | 24 | 15 |
| | **එකතුව** | **149** | **101** | **48** |

සමාලෝචිත වර්ෂය අවසාන වන විට පුරප්පාඩු 48 ක් පිරවීමට අමාත්‍යාංශය කටයුතු කර නොතිබුණි

(ආ) අවිධිමත් ලෙස වෙනත් පාර්ශවයන්ගෙන් ලබාගත් මානව සම්පත්

අමාත්‍යාංශය විසන් අවිධිමත් ලෙස ලබා ගත් මානව සම්පත් පිළිබඳ අනාවරණය වූ කරුණු පහත දැක්වේ.

| සේවක වර්ගය | සංඛ්‍යාව | වෙනත් පාර්ශවය | කාලපරිච්ඡේදය |
|---|---|---|---|
| තෘතියික මට්ටම | 01 | ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලය | 2007 වර්ෂයේ සිට මේ දක්වා |
| ප්‍රාථමික මට්ටම | 02 | - එම - | 2012 අගෝස්තු සිට මේ දක්වා |
| | 03 | | |